# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/51 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 21/78 (XV) (බී).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වන, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ පීඨයන් හා අධ්‍යයන අංශයන් නිශ්චිතව දක්වන ලද (කලින් කල සංශෝධිත) 2007 ඔක්තෝබර් මස 09 වැනි දින අංක 1518/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය එහි I වන තීරයේ සඳහන් "සම සෞඛ්‍ය විද්‍යා පීඨය"යන අයිතමය ට සහ එහි II වන තීරයේ සඳහන් "(3) වෛද්‍ය රසායනාගාර විද්‍යා අංශය" යන අයිතමය ට අනුරූප සටහන් වලට ඉක්බිතිව ම (2019 සැප්තැම්බර් මස 2 වැනි දින අංක 2139/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) පහත දැක්වෙන අයිතමය සහ සටහන් එකතු කිරීමෙන් එහි උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(4) මානව ජීව විද්‍යා අධ්‍යයන අංශය".

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 - 00010

1A - PG 6250 — 456 (2023/03)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*